# කව්ලකුණු මිණි මල හෙවත් කාව්‍ය ලක්‍ෂණ මිණි මාලාව හා එහි අන්තර්ගතය පිළිබඳ විමසුමක්

තිඹිරිවැව සිරිසුමන හිමි

## Abstract

This paper examines on the Poetry Instruction book **Kāvya Lakṣaṇa Miṇi Mālāva (Kavlakuṇu Miṇi Mala)**. Firstly, the time period and the factors that contributed to the book's composition are being examined while the author of this book called **Vidāgama** is being investigated. Secondly, an in-depth study is done on the book's content. This book investigates how a number of poetic devices that were not included in the **Elu Sadas Lakuṇa and Lakuṇu Sara** are incorporated. **Kavlakuṇu Miṇi Mala** contains a more comprehensive description of the Octameter than the two books **Elu Sadas Lakuṇa and Lakuṇu Sara**. The author of Lakuṇu Sara has also studied the letters belonging to **Brahmin, Raja, Vanik and Shudra** dynasties by linking Astrology to poetry. It further describes how **Yōni** (Sanskrit word meaning Vagina. Astrological **Yoni** is calculated by Astrologers using the birth time of each individual. They are traditionally considered as indicators of sexual libido, desire and compatibility.)should be formed in poetry and states the gender

of letters. All letters belonging to the 27 auspicious times and the gender of letters are also mentioned. Another variant of the alphabet called divine, human and nectar nature have also been stated. Evidence is found in this book that Casteism was also included in the letters. **Kāvya Lakṣaṇa Miṇi Mālāva** also addresses other fields that the author should focus on in poetry. This book of poetic devices is worthy as a handbook for **Set Kavi** (auspicious/blessing verses) and **Vas Kavi**(malefic/maledictory verses) writers. This article briefly describes about this book and its content with reference to primary and secondary sources.

***Keywords :*** *Auspicious times, Kāvya Lakṣaṇa Miṇi Mālāva (Kavlakuṇu Miṇi Mala), Letters, Octameter, Yōni,*

## හැඳින්වීම

වර්තමානය වන විට අවශේෂ ව ඇති කාව්‍ය ලක්‍ෂණ ඉදිරිපත් කෙරෙන ඉපැරණි ම ග්‍රන්ථය වනාහි **එලු සඳස් ලකුණ** යි. **එලු සඳස් ලකුණින්** අවධානයට ලක් නො වූ විෂය ක්ෂේත්‍රය ආවරණය කරමින් තත් කාලීන ව ම **ලකුණු සර** විරචිත ය. පශ්චාත් කාලීන ව රචනා වූ **කව් ලකුණු මිණි මල හෙවත් කාව්‍ය ලක්‍ෂණ මිණි මාලාව** තත් ග්‍රන්ථද්වයෙන් ඉදිරිපත් කළ කාව්‍ය ලක්‍ෂණ සවිස්තර ව දැක්වීමට උත්සාහ ගෙන තිබේ. මෙහි දී තත් ග්‍රන්ථය පිළිබඳ සංක්ෂිප්ත අධ්‍යයනයක් සිදු කිරීමට ප්‍රයත්න දරනු ලැබේ. මෙම පර්යේෂණ පත්‍රිකාවේ අක්ෂර වින්‍යාසය හා පද බෙදීම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශිත සිංහල ලේඛන ව්‍යවහාරය: උපදේශ සංග්‍රහයට (2014) අනුකූල වේ.

## පර්යේෂණ ගැටලුව

කාව්‍යකරණ විෂයෙහි ලා අක්ෂරවල ගති ස්වභාවයට හිමි ව ඇති ස්ථානය කවරරේ දැ යි විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව යි.

## අරමුණ

කුල යෝනි නැකැත් පුෂ්ප යනාදි සංකල්ප සමග අක්ෂරවල ඇති අන්තර්සම්බන්ධතාව හඳුනා ගැනීම.



## උපන්‍යාසය

අක්ෂරවලින් ඉෂ්ටානිෂ්ට සිද්ධිය වන බවට සමාජීය ඇගයුමක් හා විශ්වාසයක් පවතී.

## වැදගත්කම

**කාව්‍ය ලක්ෂණ මිණි මාලාව** පිළිබඳ ව විද්වත් විමර්ශන යොමු වී ඇත්තේ ඉතා අල්ප ව ය. තවද ඒ පිළිබඳ ව රචනා වී ඇති පර්යේෂණ ලිපි ප්‍රමාණය ද ඉතා විරල ය. ඒ නිසා ම මෙම විෂය පිළිබඳ අධ්‍යයනයේ නියුක්ත වන්නන්ට මෙය නව දැනුමක් වනු ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සම්පූර්ණයෙන් ම පුස්තකාලය අධ්‍යයනයකි.

## කව් ලකුණු මිණි මල හෙවත් කාව්‍ය ලක්‍ෂණ මිණි මාලාව

### කර්තෘ:-

**කව් ලකුණු මිණිමල** වීදාගම මහනෙත් පාමුල මහතෙරිඳු විසින් රචනා කොට තිබේ. උන් වහන්සේ විසින් තත් ග්‍රන්ථය රචනා කරන ලද බැව් **කව් ලකුණු මිණිමලේ** කර්තෘ නාම සන්දර්ශනයේ දක්වා ඇත. උන් වහන්සේ කාව්‍ය නාටක ඡන්දස් ව්‍යාකරණ අලංකාර විෂයෙහි ප්‍රාමාණිකයෙකු බව එහි ම මෙසේ සඳහන් වේ.

> ''නොයෙන් කව් නළු සඳ-වියරණලකර ලකරින්
>
> වියතුන් සැරූ මෙත් මහ-නෙත් පාමුල මහතෙරිඳු'' (**කාව්‍යලක්‍ෂණ මිණිමාලාව හෙවත් ලකුණුමිණ**. 1899: 87ගීය, 22පිටුව).
>
> වීදාගම යනුවෙන් ව්‍යවහෘත හිමිවරු දෙනමක් විසූහ (පඤ්ඤාශේඛර හිමි සහ සිරිමෙවන්, 1984:15 පිටුව). උන් වහන්සේලා දෙනම ම වීදාගම විහාරයේ වැඩ වාසය කළහ. මහා වීදාගම හිමියන් විසින් රචනා කරන ලද එකදු කෘතියක් පිළිබඳ ව හෝ සඳහන් නො වේ. වීදාගම මෛත්‍රී හිමියෝ ''වීදාගම හිමි'' නමින් හැඳින් වූ දෙ වැන්නා වූහ. උන් වහන්සේගේ නාමය දීපංකර බවත් මහළු ප්‍රව්‍රජ්‍යාවේ දී මෛත්‍රී යන නාම ග්‍රහණය කළ බවත් ඇතැමෙක් පෙන්වා දෙති (**එම. 16 පිටුව**). විදාගම

මෛත්‍රී හිමියෝ විචිත්‍ර ධර්ම කථිකයෙකි **(මෙලියස්, සිල්වා.1965:81 පිටුව)**. vi වන බුවනෙකබා රජතුමාගේ රාජ්‍ය කාලයේ පැවති බුරුම භික්ෂූන් වහන්සේලාගේ මහළු පැවිදි කර්මයේ ප්‍රමුඛත්වය වීදාගම හිමියෝ දැරූහ. ඒ බව **කල්‍යාණි ශිලා** ලිපියේ සඳහන් වේ **(කල්‍යාණි ශිලා ලිපි,**2016) 80 පිටුව). තත්කාලීන ව සමාජයේ ඉහළ පිළිගැනීමක් වීදාගම හිමියන්ට ලැබී තිබූ බව පෙනී යයි. උන් වහන්සේ **කව් ලකුණුමිණ** හැරුණු කොට කතිපය ග්‍රන්ථයක් රචනා කළහ. බුද්ධ කාලීන ව භාරත වර්ෂයේ විශාලා මහනුවර හටගත් තුන්බිය රතන සූත්‍ර දේශනාවෙන් ව්‍යූපසමනය කිරීමේ වෘත්තාන්තය අන්තර්ගත **බුදුගුණ අලංකාරය** වීදාගම හිමියන් විරචිත සිවුපද කාව්‍ය ග්‍රන්ථයකි. **(බුදුගුණ අලංකාර පිළිබඳ වළාණේ සන්නය. 2013:611කවිය.174 පිටුව)**. හංසයෙකු දූත සේවයේ යොදා ගනිමින් ශ්‍රී ජයවර්ධනපුරයේ සිට කැරගල වනරතන හිමියන් වෙත හසුනක් යැවීම සඳහා රචනා කරන ලද **හංස සංදේශය** වීදාගම හිමියන් රචනා කරන ලද එකම සන්දේශ කාව්‍යය යි. **(හංස සන්දේශය. 1964:201 කවිය. 172 පිටුව)**. කුශලාකුශල මෙන් ම පවු පින් පිළිබඳවත් ධර්මය පිළිබඳවත් සාමාන්‍ය ජනයාට අවබෝධයක් ලබා දෙනු වස් රචනා කරන ලද **ලෝ වැඩ සඟරාව** උන් වහන්සේ විසින් රචිත තවත් කාව්‍ය ග්‍රන්ථයකි. **(ලෝවැඩ සඟරා වර්ණනා. 2469:139 කවිය. 290 පිටුව)**. **දහම් ගැට මාලාව** නම් කෘතිය ද වීදාගම හිමියන් රචනා කරන ලද කෘතියක් බව ඇතැමෙකුගේ මතය යි. **(සන්නස්ගල, 1961: 285 පිටුව)**.

වීදාගම මෛත්‍රී හිමියෝ කාව්‍යකරණයේ බුහුටි බවක් දැක්වූහ. කාව්‍ය කෘති රචනා කිරීම මෙන් ම කාව්‍යකරණයට අවශ්‍ය සඳුපදේශනය සපයන **කාව්‍යලක්ෂණ මිණිමාලාව** ද රචනා කරන ලද්දේ තත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ තුබූ රුචිකත්වය හා පරිණත භාවය නිසා ය. **එළු අත්තනගලු වංශය** ද වීදාගම මෛත්‍රී හිමියන්ගේ රචනයක් ද නො වේ ද යන්න උගතුන් අතර නො විසඳුණු මත භේද දක්නට ලැබේ. **(හංස සන්දේශය. 2011: xxvii පිටුව/සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර. 1961: 280-281 පිටු/ගොඩකුඹුරේ, 1999: 135-136 පිටු/එළුඅත්තනගලු වංසය. 1965: සංඥාපනය v ,2, 3 පිටු)**.



**කාලයः-**

**කාව්‍යලක්ෂණ මිණිමාලාව** රචනා කොට ඇත්තේ කෝට්ටේ යුගයේ දී ය. තත් ග්‍රන්ථයේ කර්තෘ කෝට්ටේ යුගයේ ධරමාන වූ නිසා එම යුගයේ ම **කව්ලකුණු මිණිමල** රචනා කොට ඇති බව නිගමනය කළ හැකි ය. එසේ ම තත් ග්‍රන්ථය අවසානයේ පරාක්‍රමබාහු රජතුමාගේ සිවුපනස් වන වර්ෂයේ දී මෙම කෘතිය රචනා කරන ලද බව දක්වා තිබේ. **(කාව්‍යලක්ෂණ මිණිමාලාව හෙවත් ලකුණු මිණ. 1899: 87 ගීය, 22 පිටුව)**. ක්‍රි.ව. 1463 - 1467 අතර කාලයට මෙම කෘතිය අයත් වන බව ගොඩකුඹුරේ දක්වයි. **(ගොඩකුඹුරේ, 1999: 361 පිටුව)**. ග්‍රන්ථාගත තොරතුරුවලින් ම **කව් ලකුණු මිණිමල** කෝට්ටේ යුගයේ රාජ්‍ය විචාළ vi පරාක්‍රමබාහු රජුගේ පනස් හතර වන රාජ්‍ය වර්ෂයේ දී රචනා කරන ලද බව නිගමනය කිරීම යුක්ති යුක්ත ය.

**සංඥාः-**

වීදාගම මෛත්‍රී හිමියෝ මෙම කෘතිය **"කව්ලකුණුමිණිමල"** යනුවෙන් නාමීකරණයට ලක් කළහ. මෙහි අර්ථය කාව්‍යලක්ෂණ නැමති මැණික් මාලය යන්න යි. **එළු සඳස් ලකුණේ** හෝ **ලකුණු සරේ කව්ලකුණු මිණේ** මෙන් සියුම් කරුණු සාකච්ඡාවට භාජනය කොට නොමැති නිසා සමකාලීන කාව්‍යකරණයේ නියුක්ත වූවන්ට එම කෘතිය මැණික් මාලයක් මෙන් ප්‍රයෝජන වූ බව නිසැක ය. මේ නයින් කතුවරයා තත් කෘතියට යොදා ඇති නාමය අන්වර්ථ නාමයක් බව නිගමනය කළ හැකිය.

**නිමිත්තः-**

මෙම කෘතිය රචනා කරන ලෙස ආරාධනා කරන ලද්දේ කාව්‍යකරණයේ නියුක්ත වූ කවිගජකේශර නැමැත්තෙකි. **(කාව්‍යලක්ෂණ මිණිමාලාව හෙවත් ලකුණු මිණ 1899: 83 ගීය, 21 පිටුව)**. ඔහු ද කවීන් සමූහයකට ප්‍රධානව සිටි අයෙකු බව සඳහන් වේ. මේ කරුණුවලින් නිගමනය කළ හැක්කේ විධිමත් ව කාව්‍ය ශාස්ත්‍රය උද්ග්‍රහණය කරන්නවුන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම කෘතිය රචනා කර ඇත්තේ කවීන්ට අනිවාර්යෙන් දැන ගත යුතු කාව්‍ය ලක්ෂණ ඉදිරිපත් කරනු සඳහා ය. එහි දී ගණ, වර්ණ, නැකැත්, කාල ආදි ලක්ෂණ පිළිබඳ ව අවධානය යොමු කොට තිබේ **(කාව්‍යලක්ෂණ මිණිමාලාව හෙවත්**

ලකුණු මිණ 1899: 2 ගීය. 3 පිටුව). එලු සඳස් ලකුණ හා ලකුණු සර යන කෘතිවල පූර්වයෙන් මේ විෂය සම්බන්ධ ව සාකච්ඡා කොට තිබිණ. එහෙත් එය තත් විෂයෙහි ලා පරිපූර්ණ නො වූ නිසා කාව්‍යලක්ෂණ සියල්ල අන්තර්ගත කෘතියක අවශ්‍යතාව සම්පූර්ණ කරනු වස් මෙම කෘතිය සම්පාදනය කොට ඇති බව තහවුරු වේ.

ගී කාව්‍ය අසූ හතකින් කාව්‍යලක්ෂණ මිණිමාලාව රචනා කොට තිබේ. එලු සඳස් ලකුණේ මෙන් ම ලකුණු සරේ ද කාව්‍ය ලක්ෂණ දක්වා එයට උදාහරණ ගෙන හැර දක්වා ඇතත්, කාව්‍යලක්ෂණ මිණිමාලාවේ කිසිම කාව්‍ය ලක්ෂණයක් සඳහා නිදර්ශන දක්වා නොමැත.

අන්තර්ගතය:-

කාව්‍යලක්ෂණ මිණිමාලාව අරඹනුයේ ඉෂ්ට දේවතා නමස්කාරයෙනි. කෘතිය රචනා කිරීමේ අභිප්‍රාය ගෙන හැර දක්වන කතුවරයා කාව්‍යකරණය හා ප්‍රතිබද්ධ මූලික ලක්ෂණ ගෙන හැර දක්වයි. එහි දී ඒ අනුව අක්ෂරයන්ගේ මාත්‍රා නියමය හා ගුරු ලඝු භේදය පිළිබඳ විශේෂ අවධානයක් යොමු වී තිබේ.

තිම්සෙක් මතෙක් වෙ-එක්මත් ලුහු දෙමත් ගුරු

එද දිගුඅනර පසු හල්-ඉඳුවක් කොටින්දනේ (කාව්‍යලක්ෂණ මිණිමාලාව හෙවත් ලකුණු මිණ 1899: 11 ගීය. 3 පිටුව).

මාත්‍රා, හ්‍රස්ව, ගුරු හා ගුරු ලඝු ව්‍යවහාරය සඳහා බලපාන මූලික ලක්ෂණත් ගුරු ලඝු සඳහා භාවිත සංකේත කතුවරයා ඉතා නිරවුල් ව දක්වා තිබේ. මේ පිළිබඳ දීර්ඝ විවරණයක් කිරීමට කතුවරයා උත්සාහ නො වූ යේ එලු සඳස් ලකුණේ හා ලකුණු සරේ මේ පිළිබඳ ප්‍රමාණවත් ලෙස කරුණු විග්‍රහ වන හෙයිනි. ඉන් අනතුරු ව කාව්‍ය ලක්ෂණ මිණිමාලාවේ විග්‍රහ කොට ඇත්තේ අෂ්ට ගණයෝ ය. අෂ්ට ගණයේ ගුරු ලඝුවල ඇති මූලික ලක්ෂණ එක ගීයකින් වීදාගම හිමියෝ විවරණය කරති. එය මෙ ලෙසින් දක්විය හැකි ය.

ගුරු ලුහු තුන් මන-පෙර ගුරු ලුහු ධය වේ

මැද ගුරු ලුහු ජර හා-අතැ ගුරු ලුහු සත නම් (කාව්‍යලක්ෂණ මිණිමාලාව හෙවත් ලකුණු මිණ 1899: 12 ගීය. 4පිටුව).



අෂ්ට ගණ:-

ම ගණය:-

ම ගණයට අයත් වංශය ලෙස බ්‍රාහ්මණ වංශය දක්වන කතුවරයා ශ්‍යාම වර්ණය මෙම ගණයට අයත් බව කියයි. භූමි දේවතාවා ම ගණයට අයත් දේවතාවා වේ (-එම- 14 ගීය. 4 පිටුව). ම ගණය යෙදීමෙන් සියලු සම්පත්තිය සිද්ධ වේ (-එම- 19 ගීය. 5 පිටුව). ම ගණය හෙවත් භූමි ගණය සුබ ගණයක් ලෙස කතුවරයා හඳුන්වා දී ඇත. (-එම- 21 ගීය. 6 පිටුව). ම ගණයට අයත් නැකැත් නම් ජේට්ඨ නැකත යි (-එම- 22 ගීය. 6 පිටුව). ම ගණයට හිමි ග්‍රහයා නම් බෘහස්පති ය. එම ගණය යෙදීමෙන් ලාභ ඇති වේ (-එම- 25 ගීය. 7 පිටුව).

න ගණය

න ගණයට අයත් වංශය නම් ක්ෂත්‍රිය වංශය යි. එහි පැහැය රත්වන් ය. න ගණයට අයත් අධිපති වන්නේ දිව්‍ය ලෝකයේ දෙවියන් ය (-එම- 14 ගීය. 4 පිටුව). දේව ගණය හෙවත් න ගණය යෙදීමෙන් දීර්ඝායුෂ්ක වේ (-එම- 19 ගීය. 5 පිටුව). න ගණය ද සුබ ගණයක් ලෙස හඳුන්වා දී තිබේ (-එම- 21 ගීය. 6 පිටුව). න ගණයට අයත් නැකත නම් බෙරණ හෙවත් භරණී නැකත යි (-එම- 22 ගීය. 6 පිටුව). න ගණයට හිමි ග්‍රහයා ලෙස දක්වා ඇත්තේ බුද ය. එය යෙදීම කල්‍ය වේ (-එම- 25 ගීය. 7පිටුව).

බ ගණය

වෛශ්‍ය වංශය ද ශුභ වර්ණය ද චන්ද්‍ර දේවතාවා ද බ ගණය හා සම්බන්ධ වේ (-එම- 15 ගීය. 4 පිටුව). මෙම ගණ යෙදීමෙන් දීර්ඝායුෂ ද ඥානය ද වර්ධනය වේ (-එම- 19 ගීය. 5 පිටුව). බ ගණය ද සුබ ගණයකි (-එම- 21 ගීය. 6 පිටුව). බ ගණයට හිමි ග්‍රහයා චන්ද්‍ර වන අතර ඉන් යසස වැඩේ (-එම- 25 ගීය. 7 පිටුව). බ ගණයට මෘග ශීර්ෂ නක්ෂත්‍රය ද හිමි වේ (-එම- 22 ගීය. 6 පිටුව).

ය ගණය

ශුද්‍ර වංශයත් තද නිල් පාටත් ජල දේවතාවාත් අයත් වන්නේ ය ගණයට යි (-එම- 15 ගීය .4 පිටුව). ජල ගණයෙන් සම්පත් ධෛර්ය

සිදු වේ (-එම- 20 ගීය. 6 පිටුව). ය ගණයට හිමි ග්‍රහයා සිකුරු ය. හේ සම්පත් දෙන්නේය (-එම- 25 ගීය. 7 පිටුව). ය ගණය වනාහි සුබ ගණයකි (-එම- 21 ගීය. 6 පිටුව). ය ගණය සඳහා යෙදෙන්නේ සියවස හෙවත් ශතභිසන නැකති ය (-එම- 22 ගීය. 6 පිටුව).

ජ ගණය

ජ ගණයට කාශ්‍යප වංශය අයත් වේ. එහි වර්ණය රක්ත වර්ණය යි. එයට සම්බන්ධ දේවතාවා සූරිය දේවතාවා ය (-එම- 16 ගීය. 5 පිටුව). සූර්ය ගණයෙන් බඳනා ලදුයේ නම් දුක් ඇති වේ (-එම- 18 ගීය. 5 පිටුව). ජ ගණය අශුභ ගණයකි (-එම- 20 ගීය. 6 පිටුව). පුනාවාස නැකත රිවි ගණයට අයත් වේ.(-එම- 23 ගීය. 6 පිටුව). මෙම ගණයට අයත් ග්‍රහයා වනාහි සූර්යා වන අතර එයින් රෝග දුක් ඇති වේ (-එම- 26 ගීය. 7 පිටුව).

ර ගණය

පේසකාර වංශය ද වහ්නි ශිඛා ප්‍රභව හෙවත් ගින්නේ පාට ද (කහ) අගිනි දේවතාවා ද ර ගණයට සම්බන්ධ ය (-එම- 16 ගීය. 5 පිටුව). ගිනි ගණයෙන් භීතිය ඇති වේ (-එම- 18 ගීය. 5 පිටුව). ර ගණය අශුභ ගණයෙකි (-එම- 20 ගීය. 6 පිටුව). ර ගණයට අයත් නැකත ලෙස දක්වා ඇත්තේ කෘත්තිකා හෙවත් කැති නැකත යි. (-එම- 23 ගීය. 6 පිටුව). ර ගණයේ හිමි ග්‍රහයා කුජ වේ (-එම- 26 ගීය. 7 පිටුව).

ස ගණය

කල් කුල නම් වංශය ද වහ්නිධූම වර්ණය ද වායු දෙවියා ද ස ගණය හා සම්බන්ධ වේ (-එම- 17 ගීය. 5 පිටුව). වායු ගණය නිසා සිය දේශයෙන් භ්‍රමණය වේ (-එම- 18 ගීය. 5 පිටුව). ස ගණය අශුභ ගණයකි (-එම- 20 ගීය. 6 පිටුව). ස ගණයට හිමි නැකත වනාහි සා නැකත යි (-එම- 23 ගීය. 6 පිටුව). ස ගණයට හිමි ග්‍රහයා වන්නේ ශනි ය (-එම- 26 ගීය. 7 පිටුව).

ත ගණය

උරු වංශයෙන් ද කෘෂ්ණ වර්ණයෙන් ද ආකාශ දේවතාවාගෙන් ද ත ගණය සමන්විත වේ (-එම- 17 ගීය. 5 පිටුව). ආකාශ ගණය



අශුභ ගණයකි (-එම- 20 ගීය. 6 පිටුව). **ලකුණු සරේ** ද මෙය අශුභ ගණයක් ලෙස දක්වා තිබේ (**ලකුණුසර විවරණ.** 1956: 27 ගීය. 10 පිටුව). එසේ වුවත් ඇතැම් කෙනෙක් ආකාශ ගණය ශුභ ගණයක් ලෙස සලකති. (**කාව්‍යලක්ෂණ මිණිමාලාව හෙවත් ලකුණු මිණ.** 1899: 21 ගීය. 6 පිටුව). මෙයින් තහවුරු වන්නේ කාව්‍ය ලකුණු මිණිමාලාව ලකුණු සර යන කෘතිවල ඇති කාව්‍ය ලක්ෂණ සම්ප්‍රදායට අනුගත නො වන වෙනත් කාව්‍ය ලක්ෂණ සම්ප්‍රදායක් ශ්‍රී ලංකාවේ වර්ධනය වී තිබූ බව යි. ත ගණයට හිමි නැකත වන්නේ සුවණ නැකත යි (-එම- 23 ගීය. 6 පිටුව). ත ගණය විපත්ති ගෙන දෙන්නේ වෙයි (-එම- 26 ගීය. 7 පිටුව). ත ගණයේ ස්වාමියා වනාහි රාහු ය (-එම-).

**ඒ ඒ වංශවලට අයත් අක්ෂර :-**

බ්‍රාහ්මණ වංශය

සියලු ම ස්වරාක්ෂරත් ක යන්න, ට යන්න, ණ යන්න යන අක්ෂර බ්‍රාහ්මණ වංශයට අයත් අක්ෂරයෝ වෙති. (-එම- 28 ගීය. 8 පිටුව). ස්වරාක්ෂරවල ප්‍රමාණය පිළිබඳ මෙහි සඳහන් නොවෙතත් වර්තමාන ව්‍යවහාරයේ පවතින සියලු ම ස්වරාක්ෂර බ්‍රාහ්මණ වංශයට අයත් කළ හැකිය.

රාජ වංශයඃ-

රාජ වංශයට අයත් අක්ෂර ලෙස කාව්‍ය ලක්ෂණ මිණිමාලාවේ හඳුන්වා දී ඇත්තේ ත යන්න, න යන්න, ප යන්න, ර යන්න, ම යන්න, හා ය යන්න යන අක්ෂරයෝ ය (-එම-).

වාණිජ කුලඃ-

වාණිජ කුලයට අයත් අක්ෂර ඇත්තේ දෙකක් පමණි (-එම-).

ශුද්‍ර වංශයඃ-

සකාරය, හකාරය, ළකාරය, අක්ෂරත්‍රය ශුද්‍රවංශයට අයත් අක්ෂර ලෙස හඳුන්වා දිය හැකි ය.(-එම- 29 ගීය. 8 පිටුව).

බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන කුලවලට අයත් වූවන් සඳහා එම වංශයට අදාළ අක්ෂර මුලට යොදා කාව්‍ය බන්ධනය කිරීමේ සම්ප්‍රදායක් පැවතිණ (-එම- 30 ගීය. 8 පිටුව). බුද්ධකාලීන භාරතීය

සමාජයේ පැවැතියා මෙන් කාව්‍යකරණයේ දී විශේෂයෙන් ම සෙත්කවි මෙන් ම වස්කවි නිර්මාණය කිරීමේ දී එම වංශිකයන්ට අදාළ අක්ෂර එම කාව්‍යයේ මුලට යෙදීම සිදු කොට ඇත. මේ නයින් තහවුරු වන්නේ කුලභේදය කාව්‍යකරණය විෂයෙහි ද බලපා ඇති බව යි.

යෝනි:-

නකුල් (මුගටි), මියු (මීමා), මහවත් (බකමූණා), වග (ව්‍යාඝ්‍රයා), සපු(සර්පයා), හය(අශ්වයා) රිටු(කවුඩා), සරග(මුවා) යනුවෙන් කාව්‍ය **ලක්ෂණ මිණිමාලාවේ** යෝනි අටක් දක්වා තිබේ (**සිදත් සඟරා පුරාණ සන්නය.** 1971:243-244). එම යෝනිවලට අයත් අක්ෂර ද දක්නට ලැබේ. නකුල් යෝනියට ආ, ඔ, ත, ල, යන අක්ෂර ද, මියු යෝනියට ආ, ඕ, ද, ව, යන අක්ෂර ද, මහවත් යෝනියට ඉ, ක, න, ස, යන අක්ෂර ද, සපු යෝනියට උ, ජ, බ, එ යන අක්ෂර ද, රිටු යෝනියට එ, ඩ, ය යන අක්ෂර ද, සරුග යෝනියට ඒ, න, ර, යන අක්ෂර ද අයත් වේ (**කාව්‍යලක්ෂණ මිණිමාලාව හෙවත් ලකුණු මිණ.** 1899: 32-35 ගී. 9,10 පිටු).

මෙහි යොදා ඇති යෝනිවලින් සමහරක් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිවිරුද්ධ වේ. එම ප්‍රතිවිරුද්ධ යෝනි සංයෝජනය කොට කාව්‍යකරණයේ නියුක්ත වේ නම් එය අනිෂ්ටාර්ථ දායක වේ. එ ලෙස ප්‍රතිවිරුද්ධ යෝනි මෙ ලෙස හඳුනාගත හැකි ය.

මුගටි යෝනිය සපු යෝනිය සමග ද

මියු යෝනිය හය යෝනිය සමග ද

මහවත් යෝනිය රිටු යෝනිය සමග ද

වග යෝනිය සරග යෝනිය සමග ද

ප්‍රතිවිරුද්ධ වේ. එනම් මෙම යෝනි යටතේ වර්ගීකරණය කරන ලද අක්ෂර ප්‍රතිවිරුද්ධ නො වන ලෙසින් කාව්‍ය කරණයේ දී භාවිතයට ගැනීම දක්ෂ කාව්‍ය රචකයාගේ වගකීම යි. අෂ්ට යෝනි හඳුනා ගන්නා වූ ආකාරය පිළිබඳ කාව්‍ය **ලක්ෂණ මිණිමාලාවේ** හෙවත් **ලකුණු සරේ** අන්තර්ගත වේ (**කාව්‍යලක්ෂණ මිණිමාලාව හෙවත් ලකුණු මිණ.**1899:32-35ගී.9,10 පිටු). ප්‍රතිවිරුද්ධ යෝනිවලට අයත් අක්ෂර ගැළපෙන්නේ නම් එයින් අනර්ථ ජනනය වන ආකාරය



**කාව්‍යලක්ෂණ මිණිමාලාවේ** හෙවත් **ලකුණු මිණෙහි** ඇතුළත් වේ (එම 36 ගීය. 11 පිටුව). යම් කිසි නාමයක අක්ෂර උක්තාකාරයෙන් ප්‍රතිවිරුද්ධ ලෙස ජනනය වේ. එම අක්ෂරාර්ථය වළකාලීම සඳහා සුභාක්ෂර යෝජනය කොට කාව්‍ය බන්ධනය කරීම ස්තුති නායකයාට ඉෂ්ටාර්ථ ජනනය වන බව දක්වා තිබේ (-එම- 37 ගීය. 11 පිටුව).

**නැකැත්වලට අයත් අක්ෂර :-**

ආ, ඉ, උෟ, ඒ, යන අක්ෂර කැති නැකතට අයත් වේ (-එම- 47 ගීය. 13 පිටුව).

ඕ, වා, වි, වූ, යන අක්ෂර හෙරණ හෙවත් රෝහිණී නැකතට අයත් වේ (-එම-).

මුගහිස හෙවත් වෘග ශීර්ෂ - වේ, වෝ, කා, කී (-එම-).

අද නැකත හෙවත් ආර්ද්‍රා - කු (-එම-).

පුනාවස් හෙවත් පුනර්වෂු - කෙ, කෝ හ, හී (-එම- 48 ගීය. 17 පිටුව).

පුස හෙවත් පුෂ්‍ය - හු, හේ, හෝ, ඩා, (-එම-).

අස්ලි හෙවත් ආශ්ලේශා - ඩී, ඩූ, ඩෙ, ඩො (-එම-).

ඉහත දක්වන ලද නැකැත් හත පූර්ව වර්ගයට අයත් වේ (-එම- 57 ගීය. 15 පිටුව).

මා නැකත හෙවත් මඝාන - මා, මී, මු, මේ (-එම- 49 ගීය. 14 පිටුව).

පුවපල් ගුණ හෙවත් පූර්වඵල් ගුර්ණ - මෝ, මා, ටී, ටූ (-එම- 49 ගීය. 14 පිටුව).

තුරුපල් හෙවත් උත්‍රපල් - ටෙ, ටෝ, ප, පි (-එම- 50 ගීය. 14 පිටුව).

හත නැකත- පු (-එම- 50 ගීය. 14 පිටුව).

සිත නැකත හෙවත් චිත්‍රා - පෙ, පෝ, රා, රි (-එම- 50 ගීය. 14 පිටුව).

සා නැකත හෙවත් ස්වාති - රු, රේ, රෝ, තා (-එම- 50 ගීය. 14 පිටුව).

30 OCT 2023

විසා නැකත හෙවත් වෛශාඛ -තී, තූ, තේ, තෝ (-එම- 51 ගීය. 14 පිටුව).

මෙම නැකැත් හත ද්විතීය වර්ගයට අයත් වේ. (-එම- 58 ගීය. 115 පිටුව).

අනුර හෙවත් අනුරාධා - නා, නි, නූ, නේ (-එම- 52 ගීය. 14 පිටුව).

දෙට හෙවත් ජෙට්ඨ - නෝ, යා, යි, යු (-එම- 52 ගීය. 14 පිටුව).

මුල නැකත හෙවත් මූලා - යෙ, යො, බා, බි (-එම- 52 ගීය. 14 පිටුව).

පුවසළ නැකත හෙවත් පූර්වෂාඪ - බු යන්න (-එම- 52 ගීය.1 4 පිටුව).

තුරුසළ නැකත හෙවත් උත්තරාෂාඩා - බෙ, බෝ, ජා, ජි (-එම- 53 ගීය. 15 පිටුව).

අබිජිත් නැකත හෙවත් අභිජිත් - ජු, ජේ, ජෝ, ෂා (-එම- 53 ගීය. 15 පිටුව).

සුවණ නැකත හෙවත් ශ්‍රවණ - ෂි, ෂූ, ෂේ, ෂෝ (-එම- 53 ගීය. 15 පිටුව).

මෙම නැකැත් සත තෙවැනි වර්ගයට අයත් වේ (-එම- 59 ගීය. 15 පිටුව).

දෙනට නැකත හෙවත් ධනේෂ්ටා - ග, ගි, ගු, ගේ (-එම- 54 ගීය. 15 පිටුව).

සියවස් නැකත හෙවත් සියාවස - ගො, සා, සි, සු (-එම- 54 ගීය. 15 පිටුව).

පුවපුටුපය නැකත හෙවත් පූර්වපෝෂ්ටපද - සේ, සො, ද, දි (-එම- 54 ගීය. 15 පිටුව).

තුරුපුටුපා නැකත හෙවත් උත්තර ප්‍රෝෂ්ටපද - දු යන්න (-එම- 54 ගීය. 15 පිටුව).

රේවතී නැකත - දෙ, දො, චා, චී (-එම- 55 ගීය. 15 පිටුව).

30 OCT 2023



අස්විද නැකත හෙවත් අශ්විනි - චු, චේ, චෝ, ලා (-එම- 55 ගීය. 15 පිටුව).

බෙරණ නැකත හෙවත් භරණී - ලි, ලු, ලේ, ලෝ (-එම- 55 ගීය. 15 පිටුව).

මේ නැකැත් සතර වැනි වර්ගයට අයත් වේ (-එම- 60 ගීය. 15 පිටුව).

**අක්ෂරවල ලිංග භේදය:-**

අක්ෂරවල ලිංග භේදය පිළිබඳ තත් ග්‍රන්ථයේ කරුණු දක්වා තිබේ. ප්‍රාණාක්ෂර සමග යෙදුණු ගාත්‍රාක්ෂර ස්ත්‍රී ලිංගික ය(-එම- 62 ගීය. 17 පිටුව). ස්වරයන්ගෙන් වියුක්ත වූ අක්ෂර හෙවත් හල් අකුරු නපුංසක ලිංග වේ. (-එම- 62 ගීය. 17 පිටුව). ප්‍රාණාක්ෂරයෝ පුරුෂ ලිංගික ලෙස හැඳින්වෙති (-එම- 62 ගීය. 17 පිටුව).

**අක්ෂර :-**

මෙහි අක්ෂරයන්ගේ තවත් වර්ගීකරණයෝ දක්නට ලැබෙත්. කවර්ග, චවර්ග, ටවර්ග, තවර්ග, පවර්ග, වර්ගත්, ලඝු ස්වරත් දිව්‍ය ගති වේ (-එම- 64 ගීය. 17 පිටුව). ඕ, ත, ණ, න, ම, යන අක්ෂරත් දීර්ඝාක්ෂරත් මනුෂ්‍ය ගති වේ (-එම- 64 ගීය. 17 පිටුව). ස, හ, ය, ර, ල, ව යන අක්ෂර හය තිරිසන් ගති නම් වේ (-එම- 65 ගීය. 17 පිටුව). ට, ඨ, ඞ, ඪ යන අක්ෂර පමණක් අපාය ගති ලෙස හඳුන්වා ඇත (-එම- 65 ගීය. 17 පිටුව). ඒ හැරුණුකොට අක්ෂරවල අමෘතකලා හා විෂකලා යනුවෙන් ද උභය ප්‍රභේදයක් දක්නට ලැබේ. ලඝු ස්වර ද කවර්ගය, ච වර්ගය, ට වර්ගය, ත වර්ගය, ප වර්ගය, ය වර්ගය, ශ වර්ගය, මේ වර්ග අටට අන්තර්ගත අක්ෂර අමතක කලා නම් වේ. (-එම- 66 ගීය. 17 පිටුව). දීර්ඝාක්ෂරත් ව්‍යඤ්ජනාක්ෂරත් බින්දුව යන අක්ෂරය ද විෂකලා අක්ෂර ලෙස හඳුන්වා දිය හැකිය (-එම- 66 ගීය. 17 පිටුව). මෙහි ඇති තොරතුරුවලින් ඉපැරණි කාව්‍යලක්ෂණ පිළිබඳ සඳහන් ග්‍රන්ථක විෂකලා අක්ෂර පිළිබඳ ව සඳහන් ව තිබිණ. (-එම-). මෙයින් පෙනෙනුයේ මෙම විෂය හා සම්බන්ධ කෘති ඉපැරණි සමාජයේ භාවිත ව තිබූ බව යි. එහෙත් එම කෘති වර්තමානයේ දක්නට නො ලැබේ.

**පුෂ්ප :-**

බ්‍රාහ්මණ ක්ෂත්‍රිය වෛශ්‍ය ශුද්‍ර යන කුලවලට අයත් ද්‍රව්‍ය පවා කාව්‍යකරණයේ දී යෙදිය යුතු ආකාරය පිළිබඳ ව සම්මතයක් තිබිණ (-එම- 67 ගීය. 18 පිටුව). ඒ ඒ කුල වංශයවලට අයත් පුෂ්ප පිළිබඳ ව ද මෙහි සඳහන් වේ. බ්‍රාහ්මණයන්ට අයත්වන්නේ ජල පුෂ්පයෝ ය (-එම- 68 ගීය. 18 පිටුව). රාජවංශයට අයත් වන්නේ වෘක්ෂයන්ගේ හටගන්නා වූ පුෂ්පයෝ වෙති (-එම-). වාණිජ කුලයට පඳුරුවල හටගන්නා වූ පුෂ්ප අයත් වේ (-එම-). ශුද්‍ර කුලයට අයත් පුෂ්ප ලෙස දක්වා ඇත්තේ ලතාවල පුෂ්පයෝ ය (-එම-). බමුණන්ට සතර වර්ගයක මල් ද රාජ වංශයට වෘක්ෂ තුනක මල් ද, වෛශ්‍යයන් ට ගුල්ම පුෂ්ප දෙවර්ගයක් ද, ශුද්‍රයන්ට එක ලතාවෙක මල් ද අයත් බව කාව්‍ය **ලක්ෂණමිණිමාලාවේ** සඳහන් වේ (-එම- 69 ගීය. 18 පිටුව).

**කාව්‍යකරණයේ සැලකිය යුතු අනෙක් කරුණු :-**

කාව්‍යකරණයේ දී එහි නිරවුල්භාවය පිළිබඳ **කාව්‍යලක්ෂණ මිණිමාලා** කතුවරයා සවිඥානක ව ඇත. ශබ්ධාර්ථයෙන් තොර වූ විරුද්ධාර්ථ සම්බන්ධ නො කර ප්‍රසිද්ධ උතුම් පදවලින් කාව්‍ය බන්ධනය කළ යුතු බව අවධාරිත ය (-එම- 77,77 ගී. 20 පිටුව). පුරාණ කාව්‍ය මාර්ගය පිළිබඳ විදාගම හිමියන් විශේෂයෙන් සැලකිලිමත් වූ බව පෙනෙයි. ඒ නිසා ම ආධුනිකයන් පුරාණ කවිමගට අනුගත ව එය නො සිඳිය යුතු බව පෙන්වා දී තිබේ (-එම- 76 ගීය. 20 පිටුව). මිත්‍යාදෘෂ්ටික පාපිෂ්ට කේලාම් කියන අධර්මිෂ්ට ජාතීන් උදෙසා කාව්‍ය බන්ධනය නො කළ යුතු බව **ලකුණු මිණේ** පෙන්වා දී ඇත. (-එම- 8 ගීය. 3 පිටුව). කාව්‍යකරණය ඉතා උසස් ආස්ථානයක තබමින් කාව්‍ය බන්ධනය කළ යුතු බව මෙහි කතුවරයා විශ්වාස කොට තිබේ.

කාව්‍යකරණයේ දී ස්තුති නායකයාගේ නාමයට පෙර හා පසුව ඉෂ්ට ගණ යෝජනයත් (-එම- 31 ගීය. 8 පිටුව) ස්තුති නායකයාගේ නම දෙපසින් ශුභයෝනි යෙදීමත් (-එම- 78 ගීය. 20 පිටුව) විදාගම හිමියෝ අගය කරති.

කාව්‍යකරණයේ දී සුභ හා අසුභ ලිංග යනුවෙන් වර්ණ දෙකක් ඇත. ස්ත්‍රී ලිංග පුරුෂ ලිංග යනුවෙන් වර්ණ දෙකක් ඇත. ස්ත්‍රී ලිංග පුරුෂ ලිංග සම්බන්ධ කොට බන්ධනය ඉෂ්ටාර්ථ ජනනය කරන



බවත් නපුංසක ලිංගය හා සම්බන්ධ කොට බන්ධනය කරන කාව්‍ය අනිෂ්ටාර්ථ ජනනය කරන බවත් සඳහන් වේ (-එම- 63 ගීය. 17 පිටුව).

දශ දශාවලින් පශ්චිම දිශාව අයහපත් බවත් පෙරදිග හා උතුරු දිග ශුභ දිශාවන් බවත් එම දිශා යොදා කාව්‍ය බන්ධනය කිරීමෙන් ජයවර්ධනය කරන බවත් සඳහන් වේ (-එම- 70 ගීය. 19 පිටුව). කාව්‍යකරණයේ දී ශුභ හෝරා පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු ව තිබේ (-එම- 71-72 ගීය. 19 පිටුව).

## නිගමනය

කෝට්ටේ යුගයේ විදාගම ස්වමීන්ද්‍ර ප්‍රණීත **කාව්‍යලක්ෂණ මිණිමාලාව** හෙවත් **කවිලකුණු මිණි මලේ** උක්ත ග්‍රන්ථවල නො දක්වන ලද බොහෝ කාව්‍යලක්ෂණ දක්වා ඇත. ලෞකික ජීවිතයේ අභිමතාර්ථ සාධනය මූලික කොට ගෙන කාව්‍ය නිර්මාණය කරන්නවුන්ට විදාගම හිමියන්ගේ තත් කෘතිය අත් පොතක් වූ බව පෙනෙයි. ඉෂ්ටාර්ථ සාධනය සඳහා සෙත්කවි බැඳීමටත් අනිෂ්ටාර්ථ සාධනය සඳහා වස්කවි බැඳීමටත් උපදෙස් ලබාදෙන කාව්‍යලක්ෂණ ග්‍රන්ථයක් ලෙස **කාව්‍යලක්ෂණ මිණිමාලාව** හෙවත් **කවිලකුණු මිණිමල** හඳුන්වා දීම යුක්ති සහගත ය.

## ආශ්‍රිත ග්‍රන්ථාවලිය


ගොඩකුඹුරේ, සී. ඊ. (1999). **සිංහල සාහිත්‍ය** (බත්තරමුල්ල: (පරි .ජී. එස්. බී සේනානායක) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ඥානාලෝක හිමි, කෝදාගොඩ. (1971). **සිදත් සඟරා පුරාණ සන්නය.** කොළඹ: හේමචන්ද්‍ර වී. ගුණසේකර.

තම්බි අප්පු, ගල්කිස්සේ. (1899). (සංස්). **කාව්‍යලක්ෂණමිණිමාලාව හෙවත් ලකුණමිණ** දෙහිවල: ලක්මිණිපහණ.

දයානන්ද හිමි, ඇන්දානේ. (1956) **ලකුණුසර විවරණ.** අම්බලන්ගොඩ: ඇම්. ජේ. ද සිල්වා.

ධර්මබන්ධු ටී. ඇස්. (2469). **ලෝවැඩ සඟරා වර්ණනා.** කොළඹ: සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ධර්මාරාම හිමි, (1964). **රත්මලානේ හංස සන්දේශය.** කොළඹ: සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

පඤ්ඤාශේඛර හිමි, දේවහන්දියේ. (1984). සිරිමෙවන්, සේනක. **ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ලේඛක තොරතුරු**. බත්තරමුල්ලː සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ. (2011). **හංස සන්දේශය**. කොළඹː සූරිය ප්‍රකාශකයෝ.

පියරතන හිමි, මකුළුදූවේ. (1965). **එළුඅත්තනගලු වංසය**. කොළඹː සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

බුද්ධදත්ත, පොල්වත්තේ. (2016). **කල්‍යාණි ශිලා ලිපි**. කොළඹː සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**බුදුගුණ අලංකාර පිළිබඳ වළාණේ සන්නය**. (2013). කොළඹː සී/ස. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මෙලියස්, සිල්වා ඇම්. (1965). **ශ්‍රී රාහුල සංඝරාජ චරිතය**. කොළඹː සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර, (1961). **සිංහල සාහිත්‍ය වංශය**. කොළඹː ලේක්හවුස්.